# සිංහල භාෂාව හා සාහිත්‍යය

## විෂය නිර්දේශය

## 11 ශ්‍රේණිය

(2016 සිට ක්‍රියාත්මක කෙරේ)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

# හැඳින්වීම

අනාගත ලෝකයේ අභියෝග ජයගැනීමට සමත් දරු පරපුරක් රටට දායාද කිරීමේ කාර්ය භාරයේ වැඩි වගකීම හිමිවන්නේ අධ්‍යාපනයට ය. ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන දැනුම උකහා ගැනීම සඳහා අවශ්‍ය භාෂා කුසලතා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. සිංහල භාෂාව, ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මාධ්‍ය භාෂාව වේ. සිංහල භාෂාව ඇතුළු ව අනෙකුත් විෂය හැදෑරීම සඳහා සිංහල භාෂාව පිළිබඳ නිවැරදි දැනුම අත්‍යවශ්‍ය ය. භාෂාවේ චතුර්විධ කුසලතා වර්ධනය කර ගැනීමෙන් විෂය සාධන මට්ටම ඉහළ තලයකට නංවාලිය හැකි ය. සියලු විෂයන්හි සාධන මට්ටම වර්ධනය සඳහා භාෂා දැනුම අවශ්‍ය හෙයින් සිංහල භාෂාව පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම මවුබස සිංහල විෂයයේ වගකීමක් ලෙස හඳුනා ගෙන ඇත.

සිංහල භාෂාව සියවස් ගණනාවක් තිස්සේ විකාශනය වූ භාෂාවකි. ඒ නිසා ම එහි විවිධ වාක්‍ය රීති මෙන් ම භාෂා ව්‍යවහාර ද දක්නට ලැබේ. ඒවා අධ්‍යයනය කිරීමෙන් භාෂා මාමකත්වයෙන් යුතු ව කටයුතු කිරීමට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිංහල සාහිත්‍යය, සිංහල භාෂා විෂය සමග ඒකාබද්ධ වූ විෂය කොටසකි. දයාව, කරුණාව ආදි මානව ගුණධර්මවලින් හෙබි සුබනම්‍ය මනසකින් හා සමබර පෞරුෂයකින් යුතු සංවේදී දරු පරපුරක් බිහි කිරීම සඳහාත් සාහිත්‍ය සේවනය අත්‍යවශ්‍ය සාධකයකි.

නව විෂය නිර්දේශය සකස් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක විෂය නිර්දේශය පාදක කර ගෙන ඇත. ඒ අනුව නව විෂය නිර්දේශය ද නිපුණතා පාදක ව ඉදිරිපත් කෙරේ. මෙම විෂය නිර්දේශය සකස් කිරීමේ දී ආචාර්ය ජැනට් රෙනෝල්ඩ්ස් මහත්මියගේ සහ ආචාර්ය සෙනරත් නානායක්කාර මහතාගේ ශ්‍රී ලංකාවේ 6 - 9 ශ්‍රේණි සඳහා විෂය ප්‍රමිති රාමුව (Standards for grade 6 - 9 subjects in Sri Lankan Schools. Authors - Dr. Janet Reynolds and Dr. Senarath Nanayakkara) නමැති ලේඛනයේ ඇතැම් අංග උචිත පරිදි යොදා ගෙන ඇත.

## ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරා ලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනයෙන් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මගින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප

## මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදී ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකුල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියා උපරි ම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## විෂය අරමුණු

1. චතුර්විධ භාෂා කුසලතා හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

2. නිරවද්‍ය හා සම්මත භාෂා භාවිතයෙහි පරිචිත භාවය අත්පත් කොට ගැනීම.

3. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලි හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම සහ වාංමාලාව පෝෂණය කර ගැනීම.

4. විශ්ව විශ්‍රැත සාහිත්යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම.

5. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන, වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කරගනිමින් රසාස්වාදයට යොමු වීම හා ජීවිත පරිඥානය අත්පත් කොට ගැනීම.

6. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කරගනිමින් සමාජ, සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන හා නූතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනය.

7. සාහිත්‍යයේ පදනම වන භෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව හා තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

සිංහල භාෂාව හා සාහිත්‍යය 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි. | 1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි. | • දුකට කියන කවි සීපද (කවි පෙළ) - මහගම සේකර | • පද්‍ය පන්තියට සවන් දී අදහස පැහැදිලි කරයි.<br>• පද්‍ය නිර්මාණයේ කාව්‍යමය ලක්ෂණ අගය කරයි.<br>• පද්‍ය නිර්මාණයක ශබ්ද රසය හා අර්ථ රසයේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• පද්‍ය නිර්මාණය රසවිඳිමින් විචාරය කරයි. | 02 |
| | 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි. | • කාලීන ගුවන්විදුලි/රූපවාහිනී වැඩසටහන් ඇසුරෙන් | • විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සාවධාන ව සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>• විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සාවධාන ව සවන් දීමේ වැදගත්කම විස්තර කරයි.<br>• විද්‍යුත් මාධ්‍ය වැඩ සටහන්වලට සවන් දී රැස් කර ගත් තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |
| | 1.5 දේශන සාකච්ඡා ආදියට විචාරශීලී ව සවන්දීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි. | • විද්වත් දේශන/සාකච්ඡා | • දේශන /සාකච්ඡාවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>• දේශනයේ/සාකච්ඡාවේ ඇතුළත් කරුණු උපුටා දක්වයි<br>.• දේශනයේ/සාකච්ඡාවේ ඇතුළත් කරුණු පිළිබඳ තම මතය ප්‍රකාශ කරයි. | 03 |
| | 1.6 නිරවුල් ව හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි. | • බුද්ධි මණ්ඩල සාකච්ඡා<br>• මාතෘකානුකූල කතා (ක්‍රියාකාරකම්) | • සබකෝලයෙන් තොර ව කතා කරයි.<br>• නිවැරදි ව හා පැහැදිලි ව කතා කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>• උචිත පරිදි අංග චලන යොදා ගනිමින් කතා කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • අන්‍යයන්ගේ අවධානය දිනා ගනිමින් කතා කරයි. | |
| | 1.7 බහුවිධ මාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | • භූමිකා රංගන<br>• පෝස්ටර්<br>• පිටු පෙරළන<br>• උහිස් ප්‍රක්ෂේපණ (OHP Presentations )<br>• බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ ( Multimedia Presentations )<br>ආදී විවිධ මාධ්‍ය අවස්ථානුකූල ව යොදා ගෙන සිදු කරන ඉදිරිපත් කිරීම්. | • ඉදිරිපත් කිරීම් සඳහා යොදා ගත හැකි විවිධ මාධ්‍ය හඳුනා ගෙන විස්තර කරයි.<br>• ඉදිරිපත් කිරීම් සඳහා බහුවිධ මාධ්‍ය යොදා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• ඉදිරිපත් කිරීමේ දී බහුවිධ මාධ්‍ය නිවැරදි ව භාවිත කරයි.<br>• තාක්ෂණික මෙවලම් හැසිරවීමේ හුරුව ප්‍රදර්ශනය කරයි. | 03 |

සිංහල භාෂාව හා සාහිත්‍යය 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0<br>ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. | 2.2 විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි. | ● ජාතක කතාවක්<br>- මහා කපි ජාතකය | ● විවිධ ශෛලිවලට අනුව ලියන ලද පොත පත හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● වින්දනාත්මක ව කියවීමේ අගය ප්‍රකාශ කරයි.<br>● තේමාව හා ශෛලිය අතර සම්බන්ධතාව හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● ලේඛනයේ ශෛලිය හඳුනා ගෙන නිවැරදි ව කියවයි. | 04 |
| | 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ-කරගත් කරුණු ඉදිරිපත් කරයි. | ● චරිත කතා<br>- ශ්‍රීමත් අයිවර් ජෙනිංස් චරිතය ඇසුරින් | ● අර්ථාවබෝධයෙන් යුතු ව පොත පත කියවයි.<br>● කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.<br>● කියවීමෙන් ලත් දැනුම අවස්ථෝචිත ව භාවිත කරයි.<br>● කාලය අර්ථවත් ව ගත කිරීම සඳහා නිශ්ශබ්ද ව කියවීම යොදා ගනියි. | 02 |

# සිංහල භාෂාව හා සාහිත්‍යය 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0<br>සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි. | 3.1 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි. | • සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කිරීම. (ක්‍රියාකාරකම්) | • සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• උප්පත්ති ස්ථාන අනුව අකුරු වර්ග කරයි.<br>• අක්ෂර මාලාව ස්වර, ව්‍යඤ්ජන වශයෙන් බෙදා දක්වයි.<br>• හ්‍රස්ව, දීර්ඝ වශයෙන් ස්වර වෙන් කොට දක්වයි.<br>• අල්ප ප්‍රාණ, මහා ප්‍රාණ අක්ෂර හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• වර්ගාක්ෂර නම් කරයි.<br>• සඤ්ඤක අකුරු හඳුනා ගෙන කියයි.<br>• අන්තඃස්ථාක්ෂර හඳුනා ගෙන නම් කරයි.<br>• ඌෂ්මාක්ෂර වෙන් කොට හඳුනා ගෙන කියයි.<br>• අනුස්වාරය හා විසර්ගය හඳුනා ගෙන කියයි.<br>• අක්ෂර මාලාව නිවැරදි රූපාකාරයෙන් ලියයි. | 02 |
| | 3.2 ප්‍රායෝගික භාෂා කාර්යය මැනවින් ඉටුකර ගැනීම සඳහා සිංහල අකාරාදි පිළිවෙළ භාවිත කරයි. | • ශබ්දකෝෂ භාවිතය<br>• විශ්වකෝෂ භාවිතය<br>• අකාරාදි පිළිවෙළට වචන සකස් කිරීම. | • සිංහල අකාරාදි පිළිවෙළ මතකයෙන් ඉදිරිපත් කරයි.<br>• වචන ගොනු, නාම ලේඛන ආදිය ආකාරාදි පිළිවෙළට සකස් කරයි.<br>• ශබ්දකෝෂ විශ්වකෝෂ ආදි ග්‍රන්ථ පරිශීලනයේ දී අකාරාදිය පිළිබඳ දැනුම උපයෝගී කර ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | • අක්ෂර වින්‍යාසය රීති හා භාවිතය<br>• ලේඛන නිවැරදි කිරීම.<br>• නිවැරදි අක්ෂර වින්‍යාසය<br>• අක්ෂර වින්‍යාසය වෙනස් වීම අර්ථ ව්‍යාකූලත්වයට හේතු වන බව. | • අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති අනුගමනය කරමින් ලියයි.<br>• අක්ෂර වින්‍යාසය වෙනස් වීමෙන් අර්ථය වෙනස් වන අයුරු පැහැදිලි කරයි.<br>• අක්ෂර වින්‍යාසය රීතිවලට අනුගත ව ලේඛන නිවැරදි කිරීමට යොමු වෙයි. | 02 |
| 4.0<br>ශිල්පීය දක්ෂතා ඉස්මතු කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි. | • විරාම ලකුණු භාවිතය (මෙතෙක් උගත් විරාම ලකුණු ඇසුරෙන් ක්‍රියාකාරකම්) | • විරාම ලක්ෂණ නිවැරදි ව හඳුනා ගෙන නම් කරයි.<br>• විරාම ලක්ෂණ නිවැරදි ව යෙදීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• විධිමත් ලේඛනයේ දී නිවැරදි ව විරාම ලකුණු භාවිත කරයි. | 01 |
| | 4.2 පද බෙදීමේ රීති අනුගමනය කරමින් ලියයි. | • සමාස පද එක් ව ලිවීම<br>• විශේෂණ පද වෙන් ව ලිවීම. | • පද බෙදීමේ රීති හඳුනා ගෙන විස්තර කරයි.<br>• සමාස තනි වචනයක් සේ ලියයි.<br>• විශේෂණ පද වෙන් ව ලියයි. | 01 |
| 5.0<br>භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම | 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි. | • වාක්කෝෂය (ක්‍රියාකාරකම්) | • විවිධ ලිපි ලේඛන කියවා හඳුනා ගත් වචන ඉදිරිපත් කරයි.<br>• හඳුනාගත් වචනවල අර්ථ නිවැරදි ව ප්‍රකාශ කරයි.<br>• භාෂා භාවිතයේ දී එම වචන අර්ථවත් ව යොදයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි. | • ප්‍රස්තාව පිරුළු<br>• රූඩී (ඉඟි වැකි)<br>• යුගල පද | • සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන ඉදිරිපත කරයි.<br>• සාම්ප්‍රදායික යෙදුම් භාවිතයෙන් අදහස් රසවත් ව ඉදිරිපත් කළ හැකි අයුරු විස්තර කරයි.<br>• අදහස් ප්‍රකාශනයේ දී සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි.<br>• සාම්ප්‍රදායික යෙදුම් එක් රැස් කිරීමට පෙලඹෙයි. | 02 |
| | 5.3 භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනා ගෙන භාෂාව භාවිත කරයි. | • ප්‍රාදේශීය හා පරිමිත භාෂා ව්‍යවහාර<br>• ප්‍රත්‍යයාර්ථ නාම | • උපභාෂා ව්‍යවහාර හඳුනා ගෙන නම් කරයි.<br>• විවිධ භාෂා ව්‍යවහාර පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.<br>• ප්‍රාදේශීය හා පරිමිත භාෂා දැනුමෙන් සන්නිවේදනය පහසු කර ගනියි.<br>• ප්‍රාදේශීය භාෂා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි. | 02 |



• ප්‍රත්‍යයාර්ථ නාම හඳුනා ගෙන නම් කරයි.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0<br>සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 6.1 නාම පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි. | (තද්ධිත නාම හා කෘදන්ත නාම)<br>• සමාස<br>• විභක්ති | • තද්ධිත පද සෑදෙන අයුරු විස්තර කරයි.<br>• කෘදන්ත පද සෑදෙන අයුරු විස්තර කරයි.<br>• තද්ධිත හා කෘදන්ත හඳුනා ගෙන ලේඛනයේ යෙදෙයි.<br>• සමාස නම් කරයි.<br>• විවිධ ක්‍රම යටතේ පද සමාස වන අයුරු විස්තර කරයි.<br>• පද සමාස කර දක්වයි.<br>• අවබෝධයෙන් යුතු ව සමාස භාවිත කරයි.<br>• විභක්ති අනුව නාම පද නිවැරදි ව යොදමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 09 |
| | 6.2 ක්‍රියා පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතුව ලේඛන කාර්යයයේ යෙදෙයි. | • ක්‍රියා පද සම්බන්ධ ක්‍රියාකාරකම් | • ක්‍රියා පද හඳුනා ගෙන නම් කරයි.<br>• ක්‍රියා පදවල ප්‍රභේද ඇති බව පැහැදිලි කරයි.<br>• ක්‍රියා පද නිවැරදි ව භාවිත කර ලේඛන කාර්යයේ යෙදෙයි. | 02 |
| | 6.3 අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි. | • අව්‍යය පද (ව්‍යවහාරයේ පවතින නිපාත හා උපසර්ග) | • අව්‍යය පද යනු මොනවා දැ නම් කරයි.<br>• නිපාත හා උපසර්ග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ලේඛනයේ දී නිවැරදි අවබෝධයෙන් යුතු ව නිපාත භාවිත කරයි.<br>• උපසර්ග අර්ථවත් ව පදවල යොදයි. | 02 |
| | 6.4 පද සන්ධි කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | • ව්‍යවහාරයේ පවතින සන්ධි (ක්‍රියාකාරකම්) | • විවිධ සන්ධි වර්ග හඳුනා ගෙන නම් කරයි.<br>• විවිධ ක්‍රම යටතේ පද සන්ධි වන අයුරු විස්තර කරයි.<br>• පද නිවැරදි ව සන්ධි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.5 සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි. | • කර්තෘ කාරක, කර්ම කාරක වාක්‍ය රීති<br>• විශේෂ වාක්‍ය රීති<br>• ශංසයාර්ථය<br>• ඇත, නැත යෝගය<br>• හා, සහ නිපාත යෝගය<br>• සමඟ කැටුව නිපාත යෝගය<br>• විකල්පාර්ථ නිපාත යෝගය<br>• සමානාර්ථ නිපාත යෝගය<br>• උපමාවාචී නිපාත යෝගය | • කාල භේදය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ක්‍රියා පද නිවැරදි ව භාවිත කරයි.<br>• වාක්‍ය රීති පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.<br>• සම්මත රීති අනුගමනය කරමින් වාක්‍ය ලියයි.<br>• විවිධ රීතිවලට අයත් වාක්‍ය නිවැරදි ව ලිවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 05 |
| 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි. | 7.1 තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි. | • රාජකාරී ලිපි (ක්‍රියාකාරකම්) | • රාජකාරි ලිපි හා ව්‍යාපාරික ලිපි ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• රාජකාරි හා ව්‍යාපාරික ලිපිවල ස්වරූපය හඳුනා ගෙන විස්තර කරයි.<br>• ශිල්පීය උපක්‍රම අනුගමනය කරමින් ලේඛනයේ යෙදෙයි.<br>• ආකෘතිය පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව ලිපි ලියයි. | 01 |
| | 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි. | • දැන්වීම්<br>• වෙළෙඳ දැන්වීම්<br>• පුවත්පත් වාර්තා<br>• ආකෘති පත්‍ර සකස් කිරීම හා සම්පූර්ණ කිරීම | • විවිධ ප්‍රායෝගික ලේඛන වර්ග හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ප්‍රායෝගික ලේඛන සඳහා උචිත ආකෘතිභාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• ප්‍රායෝගික ලේඛනයේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.<br>• අවශ්‍යතා අනුව විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0<br>භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි. | 8.1 කරුණු සංවිධානය කරගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි. | • මාතෘකානුකූල රචනා ලිවීම | • රචනා මාතෘකාවට අදාළ ව කරුණු රැස් කරයි.<br>• රැස් කර ගත් කරුණු තර්කානුකූල ව පෙළගස්වයි.<br>• ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් රචනා ලියයි.<br>• නිර්මාණාත්මක ව ලේඛනයේ යෙදෙයි. | 02 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි. | • බිත්ති පුවත්පත්/පුවත්පත් ලිපි<br>• සඟරා ලිපි<br>• විශේෂාංග ලිපි (ක්‍රියාකාරකම්)<br>• කතු වැකි<br>• තීරු ලිපි | • නිර්මාණාත්මක ලේඛනයක ලක්ෂණ පැහැදිලි කරයි.<br>• නිර්මාණාත්මක ලේඛන කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• කරුණු ගොනු කරමින් ලියයි<br>• උචිත භාෂා ශෛලියක් භාවිත කරයි.<br>• සෙසු අය ආකර්ෂණය කර ගත හැකි වන පරිදි ලියයි. | 02 |
| | 8.3 සංස්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් සාරාංශකරණයේ යෙදෙයි. | • ලේඛන සාරාංශකරණය<br>- මුල් ලේඛනයේ අදහස වචන තුනෙන් එකකට සාරාංශ කිරීම. | • ලිපි ලේඛනවලින් වැදගත් කරුණු වෙන් කොට දක්වයි.<br>• වැදගත් කරුණු අර්ථවත් ව ගළපා ඉදිරිපත් කරයි.<br>• මුල් ලේඛනයේ අදහස් ආරක්ෂා වන පරිදි සාරාංශ කර දක්වයි. | 02 |
| 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කර ගනියි. | 9.1සංස්කෘතික උරුමය හා හරපද්ධති පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා ලිපි ලේඛන පරිශීලනය කරයි. | • සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ ලියැවුණු ලිපියක්<br>- දළදා පෙරහැර | • දළදා පෙරහැර හා බැඳුණු සිරිත් විරිත් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• දළදා පෙරහැර හා සම්බන්ධ සිරිත් විරිත් අගය කරයි.<br>• දළදා පෙරහැරේ සිරිත් විරිත් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• ජාතික උරුමයන්ගේ වටිනාකම පැහැදිලි කරමින් කතා කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.2 පොත පත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි. | • සුභාෂිතය (තෝරාගත් කවි 6 ක්) | • සාහිත්‍ය නිර්මාණවල ප්‍රකට වන යහ සිරිත් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• යහ සිරිත් අනුගමනය කිරීම අගය කරයි.<br>• පොතපතින් හඳුනා ගත් යහ සිරිත් අනුගමනය කරයි. | 03 |
| | 9.3 දේශිහිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි. | • දේශාභිමානී ගීතයක් | • දේශාභිමානී ගීයට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.<br>• ගීතය ඇසුරෙන් දේශිහිමානී හැඟීම් දනවන භාෂාත්මක යෙදුම් හඳුනා ගනියි.<br>• හඳුනා ගත් භාෂාත්මක යෙදුම් භාවිත කරමින් අදහස් ප්‍රකාශ කරයි.<br>• දේශාභිමානී ගීය රස විඳියි. | 02 |
| | 9.4 විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් හඳුනා ගැනීම සඳහා ලිපි ලේඛන ඇසුරු කරයි. | • මුස්ලිම් සිරිත් විරිත් ගැන ලියැවුණු ලිපියක් | • මුස්ලිම් ජනතාවගේ සිරිත් විරිත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• මුස්ලිම් ජනතාවගේ යහ සිරිත් අගය කරයි.<br>• සිරිත් විරිත් හඳුනා ගෙන සහජීවනයෙන් යුක්ත ව කටයුතු කරයි. | 02 |
| | 9.5 විවිධ ආගමික නායකයන්ගේ චරිත කතා පරිශීලනය කරයි. | • බලංගොඩ ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ චරිතය ඇසුරෙන් | • බලංගොඩ ආනන්ද මෛත්‍රේය චරිතාප්‍රදානය කියවයි.<br>• උන්වහන්සේගේ ජාතික ආගමික හා ශාස්ත්‍රීය සේවාව අගය කරයි.<br>• ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ චරිතයේ සුවිශේෂ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබාගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි | 10.1 සාහිත්‍යික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි. | • විලියම් ශේක්ෂ්පියර්ගේ චරිතය ඇසුරින් සකස් කළ ලිපියක් | • විලියම් ශේක්ෂ්පියර්ගේ චරිත කතාව කියවයි.<br>• විලියම් ශේක්ෂ්පියර්ගේ දාර්ශනික චින්තනය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>• විලියම් ශේක්ෂ්පියර්ගේ සේවය අගය කරයි.<br>• කියවීමෙන් ලත් දැනුම උචිත පරිදි භාවිත කරයි. | 02 |
| | 10.2 දැනුම ලබා ගැනීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත පරිශීලනය කරයි. | • භූ ගවේෂණය පිළිබඳ ව ලියැවුණ ලිපියක් | • පොතපත පරිශීලනයෙන් ලබා ගත් තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පාරිභාෂික වචනවල අර්ථ පැහැදිලි කිරීමට යොමුවෙයි.<br>• පාරිභාෂික වචන අර්ථවත් ව භාවිත කරයි.<br>• විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් වෙනත් පොතපත කියවීමට පෙලඹෙයි. | 02 |
| | 10.3 අද්‍යතන සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකටවන සුවිශේෂතා හඳුනා ගෙන බස හසුරුවයි. | • අද්‍යතන සාහිත්‍ය නිර්මාණවල භාෂාවේ සුවිශේෂතා | • අද්‍යතන සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කර අදහස් ප්‍රකාශ කරයි.<br>• භාෂාවේ සුවිශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• අර්ථාන්විත ව භාෂාව භාවිත කරයි. | 02 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 11.0<br>රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 11.1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි. | • වතුර මල (කෙටිකතාව)<br>- ඇරැව්වල නන්දිමිත්‍ර | • කෙටිකතාව කියවා අදහස් පළ කරයි.<br>• කෙටිකතා නිර්මාණයට පදනම් වූ මානව අත්දැකීම් විස්තර කරයි.<br>• සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන මානුෂික ගුණාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ අගය කරයි. | 02 |
| | 11.2සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි. | • සාහිත්‍ය නිර්මාණ රසවින්දනය සඳහා මග පෙන්වීම | • සාහිත්‍ය නිර්මාණ කියවා අදහස් ප්‍රකාශ කරයි.<br>• ඒ ඒ සාහිත්‍ය නිර්මාණයට අදාළ වූ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ සඳහා පාදක වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්මාණවලින් ප්‍රකට වන සාහිත්‍යමය ලක්ෂණ අගය කරයි.<br>• විවිධ සාහිත්‍ය නිර්මාණ රසාස්වාදය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.3 සාහිත්‍ය නිර්මාණ අධ්‍යයනය කර විචාර හැකියා ප්‍රදර්ශනය කරයි. | • සාහිත්‍ය නිර්මාණ විචාරය සඳහා මග පෙන්වීම. | • සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ පිළිබඳව තම අදහස් ඉදිරිපත් කරයි.<br>• විචාරය පිළිබඳ පොතපත කියවා ලබා ගත් දැනුම ප්‍රදර්ශනය කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ පිළිබඳ ව විචාරාත්මකව අදහස් පළ කරයි. | 02 |
| 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්‍යයේ යෙදෙයි. | 12.1 පද්‍ය නිර්මාණය කරයි. | • විමලරත්න කුමාරගම<br>• මහගම සේකර<br>• මොනිකා රුවන් පතිරණ<br>• දයාසේන ගුණසිංහ<br>යන කවීන්ගේ නිර්මාණ ඇසුරින් පද්‍ය නිර්මාණයට මග පෙන්වීම | • පද්‍ය නිර්මාණය සඳහා සුදුසු අත්දැකීම් තෝරා ගෙන ඉදිරිපත් කරයි.<br>• උචිත කාව්‍ය සම්ප්‍රදායක් තෝරා ගනියි.<br>• පද්‍ය නිර්මාණය සඳහා උචිත භාෂා ව්‍යවහාරය යොදා ගනියි.<br>• ඖචිත්‍යයෙන් යුතු ව කාව්‍ය උපක්‍රම භාවිත කරයි.<br>• පද්‍ය නිර්මාණයේ යෙදෙයි. | 02 |
| | 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි. | • කෙටිකතා නිර්මාණය<br>-ඇරැව්වල නන්දිමිත්‍රගේ 'වතුර මල' කෙටිකතාව ඇසුරින් කෙටිකතා නිර්මාණයට මග පෙන්වීම හා උපදෙස් ලබා දීම | • කෙටිකතා නිර්මාණයට සුදුසු අත්දැකීම් තෝරා ගනියි.<br>• සාර්ථක කෙටිකතාවක තිබිය යුතු අංග පැහැදිලි කරයි.<br>• කෙටිකතාවේ තේමාවට උචිත ලෙස සිද්ධි හා චරිත ගොනු කරයි.<br>• කෙටිකතා නිර්මාණය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 12.3 නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි. | ● නාට්‍ය පිටපත් රචනය<br><br>- ජයලත් මනෝරත්නගේ 'තල මල පිපිලා' නාට්‍යය ඇසුරෙන් නාට්‍ය පිටපත් රචනයට මග පෙන්වීම හා උපදෙස් ලබා දීම | ● නාට්‍ය රචනය සඳහා උචිත කතා වස්තුවක් තෝරා ගනියි.<br>● නාට්‍යෝචිත අවස්ථා මතුකර ගනී.<br>● නාට්‍ය රසය කුළු ගැන්වෙන පරිදි සිද්ධි පෙළගස්වයි.<br>● උචිත දෙබස් භාවිත කරමින් නාට්‍ය පිටපත් රචනා කරයි. | 02 |